සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 81 S I |
|---|---|---|
| නම: ............................................ | **කෘෂි හා ආහාර තාක්ෂණය - I** | **කාලය පැය තුනයි** |

• සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. ශ්‍රී ලංකාවේ බහුකාර්ය යෝජනා ක්‍රමයක් වන මහවැලි ව්‍යාපාරයට අයත් ජලාශ දැක්වෙන පිළිතුර තෝරන්න.
   1. කොත්මලේ ජලාශය, සේනානායක සමුද්‍රය, රන්දෙනිගල ජලාශය, රංටැඹේ ජලාශය
   2. කොත්මලේ ජලාශය, රන්දෙනිගල ජලාශය. මාදුරුඔය ජලාශය, රංටැඹේ ජලාශය
   3. ලුණුගම්වෙහෙර ජලාශය, රංටැඹේ ජලාශය, මාදුරුඔය ජලාශය, කොත්මලේ ජලාශය
   4. මාදුරුඔය ජලාශය, උඩවලව ජලාශය, ලුණුගම්වෙහෙර ජලාශය, චන්දිකා වැව,

02. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට විවිධ අංශ වල දායකත්වය දැක්වෙන ප්‍රස්තාරයක් පහත දැක්වේ.
   ඉහත A, B, හා C ට අදාළ අංශ වනුයේ,
   1. කෘෂිකාර්මික අංශය, කාර්මික අංශය, සේවා අංශයයි
   2. කාර්මික අංශය, කෘෂි කාර්මික අංශය, සේවා අංශය යි.
   3. සේවා අංශය, කෘෂි කාර්මික අංශය, කාර්මික අංශයයි.
   4. සේවා අංශය, කාර්මික අංශය, කෘෂිකාර්මික අංශයයි.




03. බෝග වගාව කෙරෙහි උෂ්ණත්වයේ බලපෑම සම්බන්ධ ප්‍රකාශ 03ක් පහත දැක්වේ.
   A - බීජ ප්‍රරෝපණය සඳහා පරිසර උෂ්ණත්වයට වඩා වැඩි උෂ්ණත්වයක් හිතකර වේ.
   B - උෂ්ණත්වය වැඩිවන විට ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාව අඩුවේ.
   C - අල බෝග වල ආකන්ද ඇතිවීම සඳහා දහවල් වැඩි උෂ්ණත්වයක් සහ රාත්‍රී අඩු උෂ්ණත්වයක් තිබීම හිතකර වේ.
   ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
   1. A හා B පමණි  2. B හා C පමණි  3. A හා C පමණි  4. A, B හා C සියල්ලමය

04. මාර්තු, අප්‍රේල්, මාසවල මධ්‍යාහ්න කාලයේදී දැඩි උෂ්ණත්වයක් පැවතීමට හා සන්ධ්‍යා කාලයේදී ගිගුරුම් සහිත වැසි ඇතිවී පසුව පැහැදිළි අහසක් දැකිය හැක්කේ,
   1. සංවහන වැසි වලදීය.
   2. නිරිතදිග මෝසම් වැසි වලදීය.
   3. ඊසානදිග මෝසම් වැසි වලදීය.
   4. වාසුළි වැසි වලදීය.

05. රූපයේ ඇති උපකරණය භාවිතා කරන්නේ?
   1. සුළං හමන දිශාව දැන ගැනීම සඳහාය.
   2. ආලෝකය පවතින කාලසීමාව දැන ගැනීම සඳහාය
   3. ආලෝක තීව්‍රතාව මැන ගැනීම සඳහාය.
   4. සුළගේ වේගය මැන ගැනීම සඳහාය.



06. ශ්‍රී ලංකාවේ දිගම දිවා දිනය හා කෙටිම දිවා දිනය ලෙස සලකනු ලබන්නේ,
   1. දෙසැම්බර් 21 හා ජූනි 21 දිනයන්ය.
   2. ජූනි 21 හා දෙසැම්බර් 21 දිනයන්ය.
   3. දෙසැම්බර් 21 හා ජූලි 21 දිනයන්ය.
   4. ජූලි 21 හා දෙසැම්බර් 21 දිනයන්ය.

07. හුණුගල් හා ඩොලමයිට් විපරිත වීමෙන් සෑදෙන පාෂාණ වර්ගයක් වන්නේ,
   1. නයිස් ය.  2. පෙග්මටයිට් ය.  3. කිරි ගරුඬ ය.  4. ෂේල් ය.

08. පසක් රතු පැහැති වීමට බලපාන හේතුවක් වන්නේ,
   1. යකඩ අඩංගු පස් ඔක්සිකාරක තත්වයේ පවතින විට ෆෙරික් ($Fe^{3+}$) අයන සෑදීමයි.
   2. කැල්සියම් ලවණ අධිකව පැවතීමයි.
   3. දුර්වල ජලවහනය නිසා ඔක්සිජන් අඩු වී යකඩ ෆෙරස් ($Fe^{2+}$)අයන බවට පත්වීමයි.
   4. කාබනික ද්‍රව්‍ය අධිකව අඩංගු වීමයි.

09. ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය පස ආම්ලික වීමට ප්‍රධානතම සාධකයක් වන්නේ,

1. කාබනික ද්‍රව්‍ය වියෝජනයේදී කාබනික අම්ල නිතර පසට එක්වීමයි.
2. අධික වර්ෂාපතනය නිසා පසේ ඇති සෝඩියම්, කැල්සියම් වැනි භාෂ්මික අයන ක්ෂරණය වීමයි.
3. අම්ල වැසි ඇතිවීමයි.
4. ලවණ සහිත වාරි ජලය එකතුවීමයි.

10. ෆැබේසියේ කුලයට අයත් අධෝභෞම ප්‍රරෝහණය පෙන්වන බෝගය වන්නේ,

1. මෑ ය. 2. උඳු ය. 3. බෝංචි ය. 4. කඩල ය.

11. ක්ෂාරීයතාවයට පත්වූ පසක් උදාසීන කිරීම සඳහා යොදා ගත හැකි ද්‍රව්‍යක් වන්නේ?

1. ඩොලමයිට් ය. 2. හුණුගල් ය. 3. ජිප්සම් ය. 4. කැල්සියම් කාබනේට් ය.

• පහත දී ඇති රූප සටහන් ඇසුරින් 12, 13 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



12. ඉහත උපකරණ අතුරින් ප්‍රාථමික බිම් සැකසීම සඳහා යොදා ගන්නා උපකරණ වන්නේ,

1. A ය 2. B ය 3. A හා B ය 4. A හා C ය

13. අතුරුයත් ගෑම සඳහා පමණක් භාවිතා කරනු ලබන්නේ,

1. A ය. 2. B ය. 3. C ය. 4. A හා B ය.

14. හිතකර පාංශු ජීවීන් බොහෝමයක් ඉතිරි වී ව්‍යාධිජනක පංශු ජීවීන් බොහෝමයක් විනාශ වන තවාන් ජීවාණුකරණ ක්‍රමයක් වන්නේ,

1. සූර්ය තාපය මගින් ජීවානුහරණයයි.
2. පිළිස්සීම මගින් ජීවානුහරණයයි.
3. උණු ජලය යෙදීම මගින් ජීවානුහරණයයි.
4. රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් ජීවානුහරණයයි.

15. රූපයේ දැක්වෙන ජල සම්පාදන ක්‍රමය වන්නේ,



1. තීරු ජල සම්පාදන ක්‍රමයයි. 2. බේසම් ජල සම්පාදන ක්‍රමයයි.
3. වළලු ජල සම්පාදන ක්‍රමයයි. 4. ඇලි වැටි ජල සම්පාදන ක්‍රමයයි.

16. ඉසින ජල සම්පාදනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - බෝගයේ මූල මණ්ඩලයට මෙන්ම පත්‍ර වලට ද ජලය සැපයිය හැකිය.

B - සුළඟ අධික ප්‍රදේශ වල වාෂ්පීකරණයෙන් ජලය අපතේ යාම වැඩිය

C - බෑවුම් සහිත වගා බිම් සඳහා යොදා ගැනීම අපහසුය

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වනුයේ,

1. A හා B ය. 2. B හා C ය. 3. A හා C ය. 4. A, B හා C ය.

17. ශාක පෝෂණය සඳහා අවශ්‍ය වන ක්ෂුද්‍ර පෝෂක පමණක් අඩංගු පිළිතුර වන්නේ,

1. සින්ක්, කොපර් හා මැග්නීසියම් ය.
2. සින්ක්, කොපර් හා කැල්සියම් ය.
3. සින්ක්, කොපර් හා මැංගනීස් ය.
4. සින්ක්, කොපර් හා සල්ෆර් ය.

18. බෝග වල පොහොර යොදන අවස්ථාව අනුව මතුපිට පොහොර යෙදීම ලෙස හඳුන්වනු ලබන්නේ,

1. බෝගයේ සිටුවීමට පෙර බිම් සකස් කිරීමේදී පසට යොදන පොහොරය.
2. බෝගය සිටු වූ පසු බෝගයට යොදන පොහොර යි.
3. බොගය සිටුවන අවස්තාවේදී පසට යොදන පොහොරයි.
4. දියර වශයෙන් පමණක් පත්‍ර මතට ඉසින පොහොරයි.

19. බෝග වගාවක සමහර ශාකවල පහත ලක්ෂණ දක්නට ලැබුණි.

• ශාකවල වර්ධනය බාලවීම. • සමහර මේරූ පත්‍ර දම්පාට වීම. • පත්‍ර පහසුවෙන් හැලීයාම.

ඉහත ලක්ෂණ වලින් හඳුනාගත හැක්කේ,

1. එම ශාකවලට නයිට්‍රජන් ඌණතාවයන් ඇති බවයි.
2. එම ශාකවලට පොටෑසියම් ඌණතාවයක් ඇති බවයි.
3. එම ශාකවලට පොස්පරස් ඌණතාවයක් ඇති බවයි.
4. එම ශාකවලට වෛරස් රෝගයක් වැළඳී ඇති බවයි.

20. වල් පැළෑටි පිළිබඳ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ.

A - පත් වර්ග වල කඳ ත්‍රිකෝණාකාර වන අතර, ඇතුළත් කුහර නැත.
පුෂ්ම මංජරියේ දිශා තුනකට විහිදීගිය පත්‍රිකා තුනක් තිබේ.

B - තෘණ වර්ග වල කඳ සිලින්ඩරාකාර වන අතර, ඇතුළත කුහර නැත.
කඳ අග්‍රස්ථයේ පුෂ්ප මංජරියක් ඇත.

C - පළල් පත්‍ර වල්පැළෑටි වල කඳ රවුම් හෝ හතරැස් වන අතර, ඇතුළත කුහර නැත.
කඳ අග්‍රස්ථයේ හෝ පාර්ශවික අතුවල පුෂ්ප හට ගනී.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,

1. A හා B ය. 2. A හා C ය. 3. B හා C ය. 4. A, B හා C ය.

21. රෝග කාරකය, රෝගය හා වැළඳෙන බෝග නිවැරදිව සඳහන් පේළිය පහත වගුවෙන් තෝරන්න.

| | රෝග කාරකය | රෝගය | වැළඳෙන රෝග |
|---|---|---|---|
| 01 | දිලීර | ඇන්ත්‍රැක්නෝස් | වී, පොල් |
| 02 | බැක්ටීරියා | දියමලන් කෑම | බටු, මිරිස් |
| 03 | වටපණු | පත්‍ර විචිත්‍රය | බණ්ඩක්කා, පැපොල් |
| 04 | ෆයිටොප්ලාස්මා | Witches Broom | රටකජු, රෝස |

22. රූපයේ ඇත්තේ සම්පූර්ණ කෘමි රූපාන්තරණ අවස්ථා දැක්වීමට අදාල සටහනකි. මෙහි A, B හා C ට ගැළපෙන පිළිතුර තෝරන්න.




1. බිත්තර, පිළවා, කීටයා
2. බිත්තර, කීටයා, පිළවා
3. බිත්තර, කීටයා, ශිශුවා
4. බිත්තර, ශිශුවා, පිළවා

23. බෝගවලට හානි කිරීමට අමතරව රෝග වාහකයින් ලෙස කටයුතු කරන පළබෝධකයින් වන්නේ,

1. කීඩෑවන් හා පැළ මැක්කන්ය. 2. කුඩිත්තන් හා කොළ හකුලන දළඹුවන්ය.
3. කීඩෑවන් හා පුරුක් පණුවන්ය. 4. පැළමැක්කන් හා පුරුක් පණුවන්ය.

24. වයස මාස 4 1/2 ක් වන සම්බා සහල් සහිත වී ප්‍රභේදය නම්,

1. BG 350 ය 2 . BG 351 ය 3. BG 300 ය 4. BG 450 ය

25. ප්‍රරෝහණය වන මුං බීජයක් රූපයේ දැක්වේ. මෙහි A ලෙස දක්වා ඇත්තේ,




1. බීජාධරයයි. 2. බීජෝපරියයි.
3. බීජ පත්‍රයි. 4. බීජ මූලයයි.

26. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික කළ බිත්තර වී වල තිබිය යුතු අවම ප්‍රරෝහණ ප්‍රතිශතය හා තෙතමන ප්‍රතිශතය ලෙස දක්වා ඇත්තේ?

1. 70% හා 14 % යි 2. 75% හා 15 % යි
3. 85% හා 13 % යි 4. 80% හා 16% යි.

27. සිටුවීම සඳහා වඩාත්ම ගැලපෙන ලෙස පිළයෙල කරන ලද දඬු කැබැල්ල දැක්වෙන පිළිතුර තෝරන්න.



01. 02. 03. 04.

28. බද්ධ කිරීම මගින් ශාක ප්‍රචාරණය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A - බද්ධ කිරීමෙන් ප්‍රචාරණය කළ හැක්කේ ද්වි බීජ පත්‍රි ශාක පමණි.

B - රඹුටන් බද්ධ කිරීමේදී ග්‍රාහක ලෙස මී, පලු වැනි ශාක යොදාගත හැක.

C - ස්වභාවික පරිසරයේදී හොඳින වැඩෙන, වල් දර්ශවල බීජ සිටුවීමෙන් ලබා ගන්නා පැළ ග්‍රාහක සඳහා වඩාත් සුදුසුය.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. A හා B ය. 2. A හා C ය 3. B හා C ය 4. A, B හා C සියල්ලමය.

29. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් ඒකීය සූර්ය ප්‍රචාරකය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. මෙහි රෝපණ මාධ්‍ය ලෙස මතුපිට පස් හා කොම්පෝස්ට් 1:1 අනුපාතයට මිශ්‍රකර ගත යුතුය.
2. මෙහි පොලිතීන් බඳුනේ ජලවහන සිදුරු දෙකක් පමණක් තැබීම සෑහේ.
3. මෙයට දින දෙකකට වරක් ජල සම්පාදනය කිරීම ප්‍රමාණවත් ය.
4. මෙය තුළ ජනනය වන උෂ්ණත්වය හා සාපේක්ෂ ආර්ද්‍රතාව මගින් මුල් ඇදීම වේගවත් වේ.

30. ජෛව ආස්තරණ පද්ධතියකට උදාහරණයක් ලෙස ගත හැක්කේ,

1. බෝග ඉපනැලි වසුන් ලෙස යොදාගෙන පාංශු තෙතමනය ආරක්ෂා කර ගැනීම.
2. බෝග වගාව හා සත්ත්ව පාලනය එකට සිදුකර සතුන්ට ආහාරත් පසට පොහොරත් ලබාදීම.
3. ප්‍රධාන බෝගයට තරඟයක් ඇති නොවන පරිදි බෑවුම් වල සේර, සැවැන්දරා ආදී බෝග වගා කිරීම.
4. අධික බෑනුම් සහිත ඉඩම්වල බිම් සැකසීමකින් තොරව බෝග සංස්ථාපනය කිරීම.

31. සූර්යාලෝකයට නිරාවරණය වීමෙන් සමහර බෝගවල අස්වැන්නෙහි ගුණාත්මක බව අඩුවීමක් සිදුවේ. ඒ සඳහා වඩාත් ගැලපෙන ප්‍රකාශය තෝරන්න.

1. සමහර අර්තාපල් ආකන්ද කොළ පැහැයෙන් යුක්ත වීම.
2. වැල් දොඩම් ගෙඩිවල හැඩය වෙනස් වී හැකිලුන ස්වභාවයක් ගැනීම.
3. තක්කාලි ගෙඩි වල රතු පැහැති පැල්ලම් ඇතිවීම.
4. තක්කාලි ගෙඩි හා අර්තාපල් අල පැලී යාම.

32. විටමින් A ඌණතාවය නිසා ඇතිවිය හැකි රෝග ලක්ෂණ වන්නේ?

1. වයසට වඩා මේරීම හා රක්තහීනතාවයයි.
2. රාත්‍රි අන්ධතාවය හා ඇසේ බීටෝ ලප ඇතිවීමයි
3. විදුරුමස් වල ආබාධ හා දත් දිරායාමයි.
4. ස්නායු ආබාධ හා ජීර්ණ පද්ධතියේ ආබාධ ඇතිවීමයි

33. මඤ්ඤොක්කා අලවල අඩුංගු ලිනමරීන් නැමති ද්‍රව්‍ය වාතයේ ඔක්සිජන් සමඟ ගැටීමෙන් සෑදෙන, මිනිස් සිරුරට විෂ සහිත සංයෝගය නම්,

1. කැල්සියම් ඔක්සලේට් ය.
2. ඇෆ්ලටොක්සින් ය.
3. කැඩ්මියම් ය.
4. හයිඩ්‍රජන් සයනයිඩ්ය.

34. ප්‍රබල කිරීම මගින් ආහාර වල අගය වැඩි කිරීම සඳහා ස්වභාවිකව අඩංගු නොවන අමතර පෝෂක එක් කරනු ලබයි. එවැනි වෙළඳ පොලේ ඇති ආහාරයක් වන්නේ,

1. මේද රහිත කිරිපිටි ය.
2. වැනිලා අයිස්ක්‍රීම් ය.
3. අයඩිනිකෘත ලුණු කුඩුය.
4. සෝයා මීට්ය.

35. ශ්‍රී ලංකාවේ උඩරට තෙත් කලාපය තුළ මනා පාලන තත්වය යටතේ වැඩිම කිරි නිෂ්පාදනයක් ලබා ගත හැකි ගව වර්ගය වන්නේ?

1. ප්‍රිෂියන් ය.
2. අයර්ෂයර් ය.
3. ජර්සි ය.
4. ඕස්ට්‍රේලියානු මිල්කින් සීබුය.

36. සතුන්ට ලබාදෙන දළ (රළු) ආහාර වල අඩංගු ජල ප්‍රමාණය මත තෙත් රළු ආහාර කාණ්ඩයට අයත් වන්නේ?

1. මොලෑසස් ය.
2. සයිලේජ්ය.
3. පිදුරු ය.
4. හේ ය.

37. ගව දෙනකගේ ගැබ් කාලය ආසන්න වශයෙන් දින

1. 305 කි.
2. 385 කි.
3. 205 කි.
4. 285 කි.

38. පහත දැක්වෙන ගොවිපල සතුන්ට බහුලව වැළදෙන රෝග කිහිපයක් හා ඊට අදාල රෝග කාරක කාණ්ඩ ඇතුළත් වගුවකි.

| සත්ත්ව වර්ගය | රෝගය | රෝග කාරක කාණ්ඩය |
|---|---|---|
| කුකුළා | කොක්සිඩියෝසිස් | B |
| ගවයා | කාලගාත්‍රා රෝගය | බැක්ටීරියා |
| කුකුළා | රානිකට් | වෛරස් |
| A | කුර හා මුඛ රෝගය | වෛරස් |

ඉහත හිස්තැන් වලට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

1. A - ගවයා / B - වෛරස්
2. A - ගවයා / B - ප්‍රෝටසෝවා
3. A - කුකුළා / B - බැක්ටීරියා
4. A - කුකුළා / B - වෛරස්

39. දිනක් වයසැති බ්‍රොයිලර් පැටවුන් බෘඩරයක් තුළ තබා ගත යුතු කාලය වන්නේ,

1. සති - 02 කි.
02. සති - 03 කි.
03. සති - 04 කි.
04. සති - 05කි.

40. වෙළඳපොලේ ඇති ආහාර ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| a | වෙළඳ පොලේ විකිණීමට ඇති සමහර කහකුඩු වර්ග පරිභෝජනයට නුසුදුසුය. |
| b | කහකුඩු වලට මෙටැනිල් කහ වර්ණකය එකතු කිරීම නිසා නිරක්තිය ඇස්පෙනීම හා ස්නායු ආබාධ ඇතිවන බව සොයාගෙන ඇත. |

ඉහත ප්‍රකාශ අතුරින්,

1. A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
2. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
3. A හා B සත්‍ය වන නමුත් එම ප්‍රකාශ දෙක අතර සම්බන්ධතාවයක් නොමැත.
4. A හා B සත්‍ය වන අතර B ප්‍රකාශය මගින් A ප්‍රකාශය වඩාත් පැහැදිළි කරයි.

## II කොටස

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04ක් ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

01) දේශගුණික විපර්යාස වලින් සිදුවන වගා හානි මෙන්ම නිෂ්පාදන ක්‍රියාවලියේ අවිධිමත් බව නිසා එළවලු, පළතුරු හා සත්ත්ව නිෂ්පාදන වල ඇතිවන ඌණතාවය මඟහරවා ගැනීම සඳහා ජනතාව ගෙවතු වගාවට යොමු කිරීම වැදගත් වේ.

i. බෝග වගාවට බලපාන දේශගුණික සාධක 04ක් නම් කරන්න.

ii. a. ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප නම් කරන්න.
    b. වැඩිම වී නිෂ්පාදනයක් සහිත ප්‍රදේශ අයත් වන දේශගුණික කලාපය කුමක්ද?

iii. a. බණ්ඩක්කා, කපු යන බෝග අයත්වන ශාක කුලය නම් කරන්න.
    b. බීජ තාවන්දමා පැළ සිටුවන සෙලනේසියේ කුලයට අයත් බෝග වර්ග 02ක් නම් කරන්න.

iv. නිවැරදි ලෙස බිම් සකස් කිරීම මගින් පසෙහි දියුණුවන භෞතික ගුණාංග 02ක් සඳහන් කරන්න.

v. a. මූල මණ්ඩලයට හානි නොවන ලෙස පැළ ලබා ගැනීම සඳහා ගෙවත්තක යොදා ගත හැකි තවාන් ක්‍රමයක් සඳහන් කරන්න.
    b. ඉහත තවාන සඳහා මාධ්‍ය ලෙස යොදාගත හැකි ද්‍රව්‍ය 02ක් නම් කරන්න.

vi. a. වගා බිමක පසෙන් ජලය ඉවත් වන ක්‍රම 02ක් සඳහන් කරන්න.
    b. බෝග වලට ජලය සම්පාදනයේ දී සැලකිය යුතු කරුණු 02ක් ලියන්න.

vii. a. විවිධ කාබනික ද්‍රව්‍ය ඇසුරෙන් ගොවිපොළේදීම නිපදවා ගත හැකි කාබනික දියර පොහොර වර්ග 02ක් සඳහන් කරන්න.
    b. දියර පොහොර නිෂ්පාදනයට පත්‍ර ලබාගත හැකි ශාක වර්ග 02ක් ලියන්න.

viii. a. කෙසෙල් පැළ වල වර්ධනය බාලවී, පත්‍ර ගොනු ගැසී සෙව්වන්දියක් ඇතිවීම සිදුවන්නේ කුමන රෝගය නිසාද?
    b. එම රෝගයේ රෝග කාරකය නම් කරන්න.

ix. a. අවශ්‍ය අවස්ථාවකදී, අවශ්‍ය ප්‍රමාණවලින්, නියමිත ගුණාත්මයෙන් යුක්තව අවශ්‍ය ආහාර වර්ගයක් ලබා ගැනීමට ඇති හැකියාව කුමන නමකින් හැඳින්වෙන්නේද?
    b. ගොවිපළක පසු අස්වනු හානි සිදුවිය හැකි අවස්ථා 02ක් ලියන්න.

x. a. කුඩා ගෙවත්තක සියුම් ක්‍රමය යටතේ කුකුළන් ඇති කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා වඩාත්ම සුදුසු ක්‍රමය කුමක්ද?
    b. ගොවිපළ සතුන්ට රෝග වැළදීමට පෙර රෝග වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග 02ක් සඳහන් කරන්න.

02) බෝග වගාවේදී වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබන්නේ පසය.

i. a. පාෂාණ ජීරණයට බලපාන භෞතික සාධන හතරක් නම් කරන්න.
    b. පාංශු පැතිකඩක පාංශු ගැඹුරට බලපාන කලාප නම් කරන්න.

ii. a. බෝග වගාවේදී ඉතා වැදගත් වන ජල අකාරය සඳහන් කරන්න.
    b. පාංශු ජලයේ වැදගත්කම් දෙකක් ලියා දක්වන්න.

iii. a. පසක් ක්ෂාරීය වීමට හේතු දෙකක් සඳහන් කරන්න.
    b. කැටායන හුවමාරු ධාරිතාවයේ වාසි තුනක් ලියන්න.

03) හිතකර පාංශු පරිසයක් සැකසීම බෝග වගාවට අත්‍යාවශ්‍ය අංගයක් වේ.

i. a. බිම් සැකසීමේ අරමුණු හතරක් ලියන්න.
    b. භෝග සංස්ථාපනයේදී නිවැරදි ගැඹුර සහ පරතරය භාවිතයෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

ii. a. බෝග සංස්ථාපන ක්‍රම තෝරා ගැනීමේදී සලකා බලන ප්‍රධාන සාධකය කුමක්ද?
    b. තවාන් භාවිතා කිරීමේදී ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න.

iii. a. බඳුන් තවාන් සැකසීමේ පියවර පිළිවෙලින් ලියා දක්වන්න.
    b. විවිධ බඳුන් වර්ග සඳහා උදාහරණ දෙකක් ලියන්න.


(6) WWW.PastPapers.WiKi (5)
Download Term Test Papers, Short Notes From One Place!

04. බෝග වගාවේදී සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට ඌණතාවයෙන් තොරව නිසි ලෙස පෝෂක ලබාදීම සිදු කළ යුතුය.

i. a. කාබනික පොහොර භාවිතයේ වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.
   b. පොහොර භාවිතය කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා වැදගත් වන කරුණු දෙකක් ලියන්න.

ii. a. නයිට්‍රජන් පෝෂක ඌණතා ලක්ෂණ හතරක් ලියන්න.
   b. නයිට්‍රජන් පෝෂකය ලබාගැනීමට හැකි රසායනික පොහොර වර්ග දෙකක් ලියන්න.

iii. a. ගොඩ ක්‍රමයට කොම්පෝස්ට් නිපදවීමේ වාසි දෙකක් ලියන්න.
   b. ඒකාබද්ධ ශාක පෝෂක කළමණාකරණය කෙටියෙන් පැහැදිළි කරන්න.

05. සාර්ථක බෝග වගාවක් සඳහා පළිබෝධ පාලනය ඉතා අත්‍යාවශ්‍ය වේ.

i. a. වල් පැළෑටිවල ප්‍රයෝජන තුනක් ලියන්න.
   b. ආක්‍රමණශීලී වල්පැලෑටි තුනක් ලියන්න.

ii. a. බෝගයට රෝග වැළඳීමට හේතු වන සාධක රෝග ත්‍රිකෝණය ඇසුරෙන් ලියා දක්වන්න.
   b. වගාබිමේ පවතින රෝග කාරකයාගේ ගහණය අඩු කිරීම සඳහා කළ හැකි උපාය මාර්ග තුනක් සඳහන් කරන්න.

iii. a. අවුලකපෝරා කෘමියා හානිකරන බෝග වර්ග හතරක් ලියන්න.
   b. අවුලකපෝරා කෘමියා බෝග වලට සිදුකරන හානියේ ආකාර දෙක සඳහන් කරන්න.

06. තම වර්ගයා බෝ කිරීමට ශාක සතු හැකියාව උපයෝගි කර ගනිමින් වගා කටයුතුවලට අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය නිපදවා ගත හැකිය.

i. a. ලිංගික ප්‍රචාරණය යනු කුමක්ද?
   b. ඒකබීජ පත්‍රී සහ ද්විබීජ පත්‍ර බීජ අතර ඇති වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

ii. a. මේරීමේ අවධිය අනුව දඬු කැබලි ආකාර මොනවාද?
   b. බද්ධයක් සඳහා අනුජයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු තුනක් සඳහන් කරන්න.

iii. වායව අතු බැඳීමේ ක්‍රියාවලිය රූප සටහන් ආශ්‍රිතව පැහැදිළි කරන්න.

07. ප්‍රශස්ථ තත්ත්ව ලබා දෙමින් ගොවිපල සතුන් ඇති කිරීම හා සත්ත්ව රෝග පාලනයෙන් උසස් ගුණාත්මකව වැඩි නිෂ්පාදනයක් ලබාගත හැකිය.

i. ගවයන්ට නිවාස සැපයීමේදී සැලකිය යුතු කරුණු තුනක් ලියන්න.

ii. ගවදෙනුන්ට වැළදෙන බුරුළු ප්‍රදාහයේදී,
   a. බුරුල්ලේ සිදුවන වෙනස්කම් දෙකක් ලියන්න.
   b. කිරිවල සිදුවන වෙනස්කම් දෙකක් ලියන්න.
   c. කෘතිම සිංචනයේ වාසි දෙකක් ලියන්න.

iii. a. ගව ප්‍රසූතිය ආසන්න වන විට දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.
   b. කිරි දෙනකගේ වියළි කාලය සඳහා ගනු ලබන දින සංඛ්‍යාව කොපමණද?



(6) WWW.PastPapers.WiKi (6)
Download Term Test Papers, Short Notes From One Place!

## 11 ශ්‍රේණිය කෘෂි හා ආහාර තාක්ෂණය I කොටස පිළිතුරු පත්‍රය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01)2 | 02)4 | 03)3 | 04)1 | 05)4 | 06)2 | 07)3 | 08)1 | 09)2 | 10)4 | 11)3 | 12)4 | 13)2 | 14)1 |
| 15)3 | 16)1 | 17)3 | 18)2 | 19)3 | 20)2 | 21)4 | 22)2 | 23)1 | 24)4 | 25)2 | 26)3 | 27)1 | 28)2 |
| 29)4 | 30)3 | 31)1 | 32)2 | 33)4 | 34)3 | 35)1 | 36)2 | 37)4 | 38)2 | 39)1 | 40)4 (ල.1×40-40) | | |

## II කොටස පිළිතුරු පත්‍රය

01) i. වර්ෂාපතනය, උෂ්ණත්වය, ආලෝකය, ආර්ද්‍රතාවය, සුළඟ (ල.1/2×4=2)

ii. a. තෙත් කලාපය,අතරමැදි කලාපය,වියළි කලාපය (ල.1/2×3= 1 1/2)

b. වියළි කලාපය (ල.1/2) (මු.ල.02)

iii. a. මැල්වේසියේ (ල.01) b. බටු, මිරිස්, තක්කාලි (ල.1) (මු.ල.02)

iv. පාංශු ව්‍යුහය, පාංශු වාතනය, පසෙහි ජලවහනය දියුණුවීමට, (ල.02)

v. a. නොරිදෝකෝ තවාන්, (කුට්ටි තවාන්)

b. මතුපිට පස්, දිරූ ගොම හෝ කොම්පෝස්ට්

vi. a. උත්ස්වේදනය, වාෂ්පීකරණය, වැස්සීම

b. වගාකර ඇති බෝගය, බෝගයේ වර්ධක අවස්ථාව, ජලය සැපයීමේ අරමුණ, පසෙහි වයනය

vii. a. කුකුළු පොහොර හෝ කොළ පොහොර නිස්සාරණය, ගැඩවිල් පණු දියර, මත්ස්‍ය තෛලෝදය (ල.1/2×2 =ල.1)

b. ඉපිල් ඉපිල්, ග්ලිරිසීඩියා, මුරුංගා පත්‍ර (ල.1/2×2 =ල.1) (මු.ල.02)

viii.a. කෙසෙල් වඳ පීදීමේ රෝගය (ල.01) b. වෛරස් (ල.01) (මු.ල.02)

ix. a. ආහාර සුරක්ෂිතතාවය (ල.01)

b. අස්වනු නෙලීමේදී, අස්වනු පිරිසිදු කිරීමේදී, තේරීම හා ශ්‍රේණිගත කිරීමේදී, අස්වනු ඇසිරීමේදී, ප්‍රවාහනයේදී සහ අස්වනු ගබඩා කිරීමේදී සහ අලෙවියේදී (ල.1/2×2-01) (මු.ල. 02)

x. a. කූඩු ක්‍රමය (බැටරි ක්‍රමය) (b) නිසි පෝෂණ ලබාදීම, සතුන් හා නිවාස පිරිසිදුව තබාගැනීම, නිසි කලට එන්නත් ලබාදීම, රෝගී සතුන් වෙන්කර තැබීම, අහිතකර කාලගුණික තත්ත්ව වලින් ආරක්ෂා කිරීම, බාහිර හා අභ්‍යන්තර පරපෝෂිතයින්ගෙන් ආරක්ෂා කිරීම, (ල.1/2×2-01) (මු.ල. 20)

02) i. a. උෂ්ණත්වය වෙනස්වීම, ජලය මිදීම, ගලායන ජලය, රැලි ක්‍රියා, සුළඟ,සතුන්, මිනිසාගේ ක්‍රියාකාරකම්, භූමිකම්පා ආදිය (ල.1/2×4=02)

b. A,B,C, කලාප වල උස (ල.01)

ii. a. කේෂාකර්ෂණ ජලය (ල.01)

b. ශාක වල ජීව ක්‍රියාවලි සඳහා, බීජ ප්‍රරෝහණය, පාංශු ජීවීන්ගේ පැවැත්මට, පාෂාණ ජීර්ණයට හා පාංශු ජනනයට, ශාක පෝෂක ශාකයට ලබාදෙන මාධ්‍යයක් ලෙස. (ල.02)

iii. a. පාංශු ජනනයේදී මාතෘ පාෂාණය මගින් පසට $NaHCo_3$ හෝ $Na_2Co_3$ එකතු වීම, ලවණ සහිත වාරි ජලය මගින් $NaHCo_3$ එකතුවීම,උෂ්ණත්වය අධික ප්‍රදේශවල වාෂ්පීකරණය වැඩිවීමෙන් පාංශු ජලයේ ඇති ලවණ පස මතුපිටට පැමිණීම. (ල.02)

b. පොහොර ලෙස පසට යොදන පෝෂක රඳවා තබා ගැනීම, අවශ්‍ය වූ විට පාංශු ද්‍රාවණයට අයන මුදාහැරීම, පස සාරවත් වීම. (ල.1×2=2)

03) i. a. පසෙහි භෞතික තත්ත්වය දියුණු කිරීම, මූල මණ්ඩලය පැතිරීයාමට පහසුවන පරිදි පස බුරුල් කිරීම, බෝගයට උචිත පරිදි භූමිය සකස් කිරීම, ගල් මුල් ආදීය පසෙන් ඉවත් කිරීම, පසටපොහොර මිශ්‍ර කිරීම, පලිබෝධ පාලනය, (ල.1/2×4=02)

b. ප්‍රරෝහණය පහසුවීම, අතු පැතිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත්ව සැපයීම, මුල් වර්ධනයට ප්‍රමාණවත් ඉඩකඩ ලැබීම, පළිබෝධ හානි අවම වීම, ශාක අතර තරගාකාරිත්වය අමව වීම, භූමිය කාර්යක්ෂම ලෙස භාවිතා කළ හැකිවීම.

ii. a. රෝපණ ද්‍රව්‍ය වල ස්වභාවය, b. පැළවලට ගැළපෙන පරිසර තත්ත්ව පාලනය කළ හැකිවීම, ශක්තිමත් හා නීරෝගීමත් වැඩි පැළ සංඛ්‍යාවක් නිපදවාගත හැකිවීම, සෘජුවම ක්ෂේත්‍රයේ සිටුවීමට අපහසු කුඩාබීජ වලින් පැළ නිපදවා ගත හැකිවීම, කුඩා පැළ පහසුවෙන් රැකබලා ගත හැකිවීම, නීරෝගී ශක්තිමත් පැළ පමණක් සිටුවිය හැකිවීම, සමාන වර්ධන සහිත පැළ තෝරාගැනීමෙන් ක්ෂේත්‍රයේ ඒකාකාරී වගාවක් ලබාගත හැකිවීම, බද්ධ කිරීමට ග්‍රාහක පැල ලබාගත හැකිවීම, (ල.1/2×4=02)

iii. a. සපයාගත් බඳුන්වල පතුලේ සහ අවශ්‍යනම්, පැතිවල සිදුරු කිහිපයක් සාදා ගැනීම, බඳුන පිරවීමේදී මුදුනේ සිට 2cm පමණ ඉතුරු වන තවාන් මිශ්‍රණයක් පුරවා ගැනීම, කුඩා බඳුන්වලට තනිවද කට පළල් බඳුන්වලට සමූහ වශයෙන්ද බීජ දැමීම.

b. බඳුනේ මැද බීජ දෙකක් හෝ තුනක් සිටුවා තවාන් මිශ්‍රණයෙන් බීජ වසා හොඳින් තද කිරීම, මතුපිටින් ජලය ස්වල්පයක් එක්කිරීම.

b. ප්ලාස්ටික් කෝප්ප, පොල්ලෙලි, කිරි හට්ටි, ප්ලාස්ටික් බඳුන් පොලිතින් බඳුන්, පොල් කටු ආදී ලෙස (ල.1/2×2=01)

iv. a. සියලුම පෝෂ පදාර්ථ අඩංගු බැවින් පරිපූර්ණ පොහොරකි. දීර්ඝ කාලයක් අඩුවේගයකින් පසට පෝෂ පදාර්ථ නිදහස් කරයි. කැටායන හුවමාරු ධාරිතාවය වැඩිකරයි. පාංශු ව්‍යුහය හා ජල අවශෝෂක ධාරිතාවය



(2) WwW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

වැඩි කරයි, ක්ෂුද්‍රජීවී ගහණය වැඩිකරයි, පීඑච්අගය නොවෙනස්ව තබා ගනී. (ල.)

b. පසෙහි අඩංගු පෝෂක ප්‍රමාණය, දේශගුණික තත්ත්ව, පසෙහි තෙතමන තත්ත්වය, සුදුසු පොහොර යෙදීමේ ක්‍රමය, පොහොර වර්ගය තෝරා ගැනීම, (ල.1/2 ×2= 01)

ii. a. මේරූ පත්‍ර කහපාට වීම, වර්ධනය අඩුවී ශාක කුරුවේ, මල් හා ඵල විකෘති වේ, අස්වැන්න අඩුවේ. (ල.1/2×4=02)

b. යූරියා, ඇමෝනියම් සල්ෆේට් (ල.1×2=02)

iii. a. පහසු ක්‍රමයක් වීම.

05) i. a. සත්ත්ව ආහාර ලෙස, පාංශු ඛාදනය අඩුවීම, වසුන් යෙදීම, කොම්පෝස්ට් සෑදීම, ඇතැම් ශාකා මනුෂ්‍ය ආහාර සඳහා, අලංකාරයට

b. ගදපාන, පාතීනියම්, ඇලිගේටර්,යෝධ නිදිකුම්බා (ල.1/2×3= 1 1/2)

ii. a. පරිසරය

ධාරකයා (ල.1/2×3= 1 1/2)

රෝග කාරකයා

b. රෝගී ශාක පුළුස්සා විනාශ කර දැමීම, පස ජීවාණුහරණය කිරීම, දිලීර ශාක හෝ වටපණු නාශක යෙදීම. (ල.1/2×3= 1 1/2)

iii. a. පතෝල, වැටකොළු, කැකිරි, පිපිඤ්ඤා ඇතුළු කුකර්බිටේසියේ කුලයේ බෝග (ල.1/2×4= 02)

b. සුහුඹුලා පත්‍රවලට , කීටයා මුල්වලට

06) i. a. පරාගනයෙන් අනතුරුව, ඩිම්බ සෛල හා පරාග සෛල සංසේචනය සිදුවීම, ජායාජන්මාණු හා පුං ජන්මාණු නිපදවා සංසේචනය සිදුකිරීම.

b.

| ඒකබීජ පත්‍රී | ද්විබීජ පත්‍රී |
|---|---|
| • බීජ පත්‍ර ඒකකි. | • බීජ පත්‍ර දෙකක් ඇත. |
| • භ්‍රෑණ පෝෂයක් ඇත. | • නැත |
| • තන්තු මුල් ඇත. | • මුදුන් මුලක් ඇත. |

(ල.1×2=02)

ii. a. ලා දඬු, අඩදළ දඬු, දළ දඬු

b. ප්‍රමාණාත්මක හා ගුණාත්මක බවෙන් යුතු ප්‍රභේදයක් වීම, රෝග වලින් තොරවීම, ග්‍රාහක කඳේ විෂ්කම්භයට ගැළපීම, සක්‍රීය අංකුර තිබීම. (ල.1×3=03)

iii.



විස්තර කිරීමට (ල.1/2 × 3=1.5) } ල.03
රූප සටහනට (ල.1/2 × 3=1.5)

07) i. ගව නිවාසය පිහිටුවන ස්ථානය, යෙදාගනු ලබන අමුද්‍රව්‍ය, ගව නිවාසයට වෙන්කරනු ලබන ඉඩකඩ පිළිබඳව (ල.1×3=03)

ii. a. බුරුල්ල ඉදිමීම, රත්පැහැ ගැන්වීම, උණුසුම් බව, තද ගතියක් ඇතිවීම. (ල.1/2×2=01)

b. වර්ණය කහ රෝස හෝ රතු පැහැ වීම, කිරිවල වයනය වෙනස්වීම, කිරි අස්වැන්න අඩුවීම,(ල.1/2×2=01)

c. උසස් වර්ගයේ එක් සතකුගේ ශුක්‍රාණු ගබඩා කර වසර ගණනාවක් භාවිතා කල හැකිවීම, උසස් ගති ලක්ෂණ ඇති ආබාධිත පිරිමි සතෙකු වුවද අභිජනන කාර්යට යොදාගත හැකිවීම, ලිංගික රෝග බෝවීමේ අවධානම අඩුයි, සහාභිජනනය පාලනය කරගත හැකිවීම. (ල.1×2=02)

iii. a. සතා වරින් වර ලැගීම හා නැගිට සිටීම, නිතර නිතර මූත්‍රා කිරීමට තැත් කිරීම, සතා නොසන්සුන් බව, දියර බෑගයපිටතට නෙරා ඒම, පැටවා පිටතට එවීමට තැටමීම. (ල.1×2=02)

b. දින 60 (මාස 02) (ල.01)

PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**